ඝාතන සිදුවීමක් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී පුවත්පත් කිහිපයක දැක්වුණු සිරස්තල පහත පරිදි වේ.

"යකඩ ඉන්නෙන් ඇන අම්මා මැරූ මන්ද මානසික පුත්‍රයා අත්අඩංගුවට" - දිවයින (පෙබරවාරි 01, 2022)
"පුතාගේ යකඩ ඉනි පහරින් මියගිය මවගේ සිරුර දින 5ක්ම ගේ ඇතුළේ", අන්තර්ගතය තුළ: "මන්ද මානසික පුතා" - මව්බිම (පෙබරවාරි 01, 2022)

ආබාධ සහිතව ජීවත් වන අය හැඳින්වීමේදී පුද්ගල-ප්‍රථම භාෂාවක් භාවිතා කිරීම වඩාත් යෝග්‍ය නොවන්නේද යන පැනය Ethics Eye අපි අසනුයේ, ඒ ඔස්සේ පොදුවේ ආබාධ සහිතව ජීවත් වන සැමදෙනෙකුටම සමාජය තුළ ගර්හාවකට හෝ කොන් කිරීමකට ලක් නොවී ජීවත් වීමේ ප්‍රවේශයක් ලැබීම සඳහායි.

එසේ නම්,

ඔබ සිතන ලෙසට, මෙම ඝාතන සිදුවීමේ සැකකාර අය හැඳින්වීම සඳහා "මන්ද මානසික" යන යෙදුම ගැටළුවක් නැතැයි ඔබ සිතන්නේ ද? නැතිනම් ඒ යෙදුම් වෙනුවට, "මානසික ආබාධයකින් යුතු"/ "මානසික ආබාධයක් සහිත" වැනි යෙදුමක් වඩාත් නොගැලපෙන්නේ ද?